# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2023.05.04 |

උපදෙස් ලිපි අංක 2023(2)

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>**පැරණි සේවකයින් අනුමත කිරීම හා 02/2022 අනුව අන්තර්ග්‍රහණය කිරීම.**</u>

දකුණු පළාතේ සියලු සමිති වල 2022.05.01 දිනට පෙර බඳවා ගෙන මේ දක්වා කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන නොමැති සේවකයින් ස්ථිර කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට ලබා දී තිබූ කාලය 2022.12.31 දිනෙන් අවසන් වූ අතර, ඇතැම් සමිති පැරණි සේවකයින් අනුමත කිරීම සඳහා මේ වන විටත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැති බව අනාවරණය වී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් සේවකයන්ගෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව සලකා බලා තවදුරටත් එම කාලය දීර්ඝ කිරීමට කොමිෂන් සභාවේ අවධානය යොමු වූ අතර, ඒ අනුව පැරණි සේවකයින් අනුමත කිරීම සඳහා කොමිෂන් සභාවට යොමු කිරීමේ කාලය 2023.06.30 දින දක්වා දීර්ඝ කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

02. ඒ අනුව අදාළ ස්ථිර කිරීම් සඳහා වන අයදුම්පත් 2023.06.30 දිනට පෙර මෙම කාර්යාලයට යොමුකරන ලෙස කොමිෂන් සභාවේ නියෝගය පරිදි දන්වමි.

03. එසේම, 02/2022 නව වැටුප් චක්‍රලේඛණය අනුව සේවකයින් නව වැටුපට අන්තර්ග්‍රහණය කිරීමේ ආකෘති පත්‍ර ද 2023.06.30 දිනට පෙර මෙම කාර්යාලයට යොමු කල යුතු අතර, ඉන් අනතුරුව එම අන්තර්ග්‍රහණ ආකෘති පරීක්ෂා කර අනුමැතියට යොමු කිරීම සිදු කරන බවද කොමිෂන් සභාවේ නියෝගය පරිදි දන්වමි.

04. තවද, 2023.06.30 දිනට පෙර විශ්‍රාම ගන්නා සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම් ආකෘති ප්‍රමුඛතාව ලබාදී මා වෙත යොමු කලයුතු බවද වැඩිදුරටත් කොමිෂන් සභාවේ නියෝගය පරිදි දන්වමි.

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත -
1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ........ සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමූ.සං.ප්‍රා.නි. හරහා අදාළ සමිති දැනුවත් කිරීම සඳහා
3. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk